ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

# කාර්යසාධන වාර්තාව - 2018

## පටුන | පිටුව


| පටුන | පිටුව |
|---|---|
| හැඳින්වීම | 03 |
| දැක්ම | 04 |
| මෙහෙවර | 04 |
| කාර්යභාරය | 05 |
| නිමැවුම | 05 |
| සේවාව වැඩි දියුණු කිරීම | 06 |
| කාර්ය මණ්ඩලය | 06 |
| 2018.12.31 දිනට කාර්ය මණ්ඩලය | 07 |
| 2018.12.31 දිනට කාර්ය මණ්ඩල සාරාංශය | 10 |
| තොරතුරු තාක්ෂණය සහ කළමනාකරණය | 10 |
| පුහුණුව සහ හැකියා වර්ධනය | 11 |
| දේශීය පුහුණුව | 12 |
| දේශීය පුහුණුව - මාණ්ඩලික ශ්‍රේණිය | 13 |
| විදේශ පුහුණුව - මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් සහ සංවර්ධන නිලධාරීන් | 14 |
| දැනුවත් කිරීමේ වැඩසටහන් | 15 |
| ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන | 15 |
| මොන්ට්‍රියල් සම්මුතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 15 |
| ජාතික විගණන පනත පිළිබඳ දේශනය | 15 |
| අන්තර්ජාතික වෙළඳාම පිළිබඳව දැනුවත් වීම | 15 |
| සුභසාධනය | 16 |
| යටිතල පහසුකම් සංවර්ධනය | 16 |
| 2018 වර්ෂය තුළ ප්‍රකාශයට පත් කරන ලද නව විධිවිධාන | 16 |
| ආනයන සහ අපනයන විධිවිධාන (ප්‍රමිතිකරණය සහ තත්ත්ව පාලනය) | 17 |
| ග්ලයිෆොසේට් ආනයනය මත පැනවූ තහනම ඉවත් කිරීම | 17 |
| වාහන වායු විමෝචන ප්‍රමිති සහ ආරක්ෂණ මිනුම් නව විධිවිධාන ප්‍රකාශයට පත් කිරීම | 17 |
| ශ්‍රී ලංකාව තුළ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනාව-1540 ක්‍රියාවට නැංවීම | 18 |
| පූර්ව නැව්ගත කිරීම් පරීක්ෂණ සහතිකය | 19 |
| ආදායම් විශ්ලේෂණය | 19 |
| ආදායම | 19 |
| වියදම් විශ්ලේෂණය | 20 |
| මූල්‍ය ප්‍රභව | 20 |
| ආදායම් සහ වියදම් විශ්ලේෂණය - 2018 | 21 |
| 2018 වර්ෂයේදී නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව (වර්ගීකරණය) | 21 |
| 2018 වර්ෂයේදී නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව | 23 |
| පසුගිය වසර 5 තුළ නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව | 24 |
| පසුගිය වසර 5 තුළ නිකුත් කරන ලද බලපත්‍ර පිළිබඳ දත්ත සමාලෝචනය | 24 |
| සමාප්ති සටහන | 25 |
| ඇමුණුම: සංවිධාන සටහන | 26 |

# හැඳින්වීම

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව 1969 අංක 01 දරන ආනයන හා අපනයන පාලන පනත මගින් 1969 වර්ෂයේදී ස්ථාපිත කරන ලද්දේ ශ්‍රී ලංකාවේ ආනයන සහ අපනයන පාලනය කිරීමේ අරමුණ පෙරදැරි කරගෙනය. මෙම දෙපාර්තමේන්තුව නියාමන අධිකාරියක් වශයෙන්, ආනයන සහ අපනයන බලපත්‍ර පාලනයට යටත් කිරීමේ වගකීම දරමින් මෙරට ආර්ථිකය තුළ ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරයි. 1977 වර්ෂයට පෙර, ආනයන සහ අපනයන සම්බන්ධ සීමා රැසක් පැවතීම හේතුවෙන් දෙපාර්තමේන්තුව වෙත අධික වැඩ කොටසක් පැවරිණි. 2019 වර්ෂයේදී ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව ජාතිය කෙරෙහි සිය 50 වසරක සේවාවක් සම්පූර්ණ කරයි.

ආනයන සහ අපනයන විධිවිධාන සකස් කිරීමෙන් සහ ආනයන සහ අපනයන ප්‍රවර්ධනය කිරීම පිණිස පහසුකම් සැලසීමෙන් දෙපාර්තමේන්තුවේ මෙහෙවර පුළුල් වී ඇත. ජාතික ආරක්ෂාව, ආර්ථිකය, මහජන සෞඛ්‍යය සහ පරිසරය කෙරෙහි සැලකිල්ල යොමන මෙහෙවර ප්‍රකාරව මෙකී කාර්යයන් ඉටු කෙරේ. මෙරට දේශීය කර්මාන්ත, පරිසරය සහ ජනතාව ආරක්ෂා කරනු පිණිස ආනයන සහ අපනයන අයතම ප්‍රමිතිගත කිරීමට ලක් කෙරෙන අතර විනිමය පාලන දෙපාර්තමේන්තුව සමග එක්ව අවශ්‍ය ප්‍රතිපත්තිමය රාමු ක්‍රියාත්මක කිරීම තුළින් මුදල් විශුද්ධිකරණ කටයුතුද පාලනය කෙරේ.

බේසල්, රොටර්ඩෑම් සහ ස්ටොක්හෝම් වැනි අන්තර්ජාතික සම්මුතීන්ට අනුව පරිසරයට සහ මහජන ආරක්ෂාවට හානිකර බලපෑමක් ඇති කරන අයතම පාලනය කිරීමට හෝ තහනම් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. 2018 වර්ෂයේදී, සාම්ප්‍රදායික විදුලි පේනු සහ කෙවෙනි තහනම් කර ඇම්පියර් 13 විදුලි පේනු සහ කෙවෙනි සඳහා එකම ප්‍රමිතියක් හඳුන්වා දීම පිණිස විධිවිධාන පැනවීම මෙයට උදාහරණයකි. ජගත් රේගු සංවිධානය විසින් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සෑම වර්ෂ 4කටම වරක් සංශෝධනය කරනු ලැබේ. එම සංශෝධනය අනුව, මුදල් අමාත්‍යාංශය සහ ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද ආදායම් ආරක්ෂණ නියෝගයද සංශෝධනය කර ආනයන හා අපනයන සඳහා පාලනයට යටත් කරන ලද අයතම ලැයිස්තුවද ප්‍රකාශයට පත් කරන ලදී.

ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව නව ස්වයංක්‍රීය පරිගණක පද්ධතිය සකස් කිරීම උදෙසා කටයුතු සම්පාදනය කිරීමේ කාර්යය නිමකර වෙළඳ ප්‍රජාවට කාර්යක්ෂම සහ ඵලදායී සේවාවක් ලබා දීම සහතික කරනු පිණිස අයදුම්පත්‍ර මාර්ගගතව ඉදිරිපත් කිරීමේ හැකියාව ස්ථාපිත කර ඇත. පූර්ණ ස්වයංක්‍රීය බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය නුදුරු අනාගතයේදීම ස්ථාපිත කෙරෙනු ඇත.



# දැක්ම

"යහපත් අනාගතයක් උදෙසා පරිසරය සහ මහජනතාව සුරක්ෂිත කිරීම."

# මෙහෙවර

"රටේ ආරක්ෂාව, ආර්ථිකය, මහජන සෞඛ්‍යය, පරිසර සංරක්ෂණය ආදිය සැලකිල්ලට ගෙන භාණ්ඩ ආනයන හා අපනයන පාලනය සම්බන්ධයෙන් රජය විසින් වරින්වර ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ 1969 අංක 1 දරණ ආනයන හා අපනයන පාලන පනත අනුව ක්‍රියාත්මක කිරීම."

# කාර්යභාරය

- ආනයන හා අපනයන පාලනය සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය රෙගුලාසි සකස් කිරීම සහ ප්‍රසිද්ධ කිරීම.
- ආනයන හා අපනයන බලපත්‍ර නිකුත් කිරීමට යටත්ව තෝරාගත් භාණ්ඩ හෝ අයිතම ආනයනය හා අපනයනය පාලනය කිරීම
- ආනයන හා අපනයන බලපත්‍ර ගාස්තු එක්රැස් කිරීම
- ආනයන හා අපනයන පාලන විධිවිධාන පිළිබඳ කරුණු සම්බන්ධයෙන් රේගු අධ්‍යක්ෂ ජනරාල්ට සහ බැංකුවලට සහාය වීම
- ආනයන හා අපනයන පාලන විධිවිධාන හා සම්බන්ධ මෙහෙයුම් උපදෙස් වාණිජ බැංකුවලට නිකුත් කිරීම

# නිමැවුම

- 2018 වර්ෂය තුළ ආනයන හා අපනයන පාලනයට යටත්ව මෙරට සහ මෙම ආර්ථිකයේ යහපත උදෙසා බලපත්‍ර 15,775ක් නිකුත් කිරීම මගින් දෙපාර්තමේන්තුවේ මෙහෙවර සාක්ෂාත් කරන්නා ලදී.
- පහත සඳහන් කටයුතුවලට අදාළව ගැසට් නිවේදන ප්‍රකාශයට පත් කරන ලදී.
  - ආනයනික අයිතම 122 ක් සඳහා තත්ව පරීක්ෂණ ක්‍රමයක් හඳුන්වාදීම.
  - ග්ලයිෆොසේට් ආනයනය මත පැනවූ තහනම ඉවත් කිරීම.
  - වාහන වායු විමෝචන ප්‍රමිති සහ ආරක්ෂණ මිනුම් හඳුන්වාදීම මගින් යුරෝ iv ප්‍රමිතිවලට අනුකූලව වාහන ආනයනය කිරීමේ ප්‍රමිති ඉහළ නංවාලීම
- උපායමාර්ගික වෙළඳ පාලන ක්‍රමයක් සහ ගෝලීය බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමයක් ඇති කිරීම මගින් ශ්‍රී ලංකාව තුළ එක්සත් ජාතීන්ගේ ආරක්ෂණ මණ්ඩල යෝජනාව 1540 ක්‍රියාවට නැංවීම පිණිස අදාළ රාජ්‍ය ආයතන සමග සාකච්ඡා / රැස්වීම් සහ වැඩමුළු පවත්වන ලදී.
- භාණ්ඩ බලපත්‍රවලට අනුකූලව ආනයනය කළ බව සනාථ කළ පසු හර කිරීම් මගින් ආනයන පාලනය නියාමනය කිරීම.
- ආනයන හා අපනයන පාලන ප්‍රතිපත්තිවලට අනුව, ආනයන කටයුතු සඳහා වැය නොකළ විදේශ විනිමය පදනම මත බලපත්‍ර ලබාදීම.
- ආනයන හා අපනයන පාලන විධිවිධානවලට අනුකූල නොවන අවස්ථාවේදී රේගු අධ්‍යක්ෂ ජනරාල්ට සහ විනිමය පාලකට අවශ්‍ය සහාය ලබාදීම.
- ආනයන හා අපනයන පාලනයට අදාළව මෙහෙයුම් මාර්ගෝපදේශ වාණිජ බැංකුවලට නිකුත් කිරීම.
- බලපත්‍ර ගාස්තු වශයෙන් රු. බිලියන 1.56ක් එක්රැස් කර ඒකාබද්ධ අරමුදලට බැර කිරීම.

# සේවාව වැඩි දියුණු කිරීම

දෙපාර්තමේන්තුව විසින් සිය සේවාව වැඩි දියුණු කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ ව්‍යුහය වෙනස් කිරීම (කාර්යාලයීය ඉඩකඩ පුළුල් කිරීම), යටිතල පහසුකම් සංවර්ධනය, සුභසාධනය වැඩි දියුණු කිරීම, වඩා කාර්යක්ෂම හා ඵලදායී තොරතුරු තාක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම සහ හැකියාවන් සංවර්ධනය සහ අඛණ්ඩව සේවා වර්ධනය අරමුණු කර ගනිමින් කාර්ය මණ්ඩලයට පුහුණු අවස්ථා ලබාදීම වැනි විවිධ පියවර රැසක් ගන්නා ලදී.

## කාර්ය මණ්ඩලය

දෙපාර්තමේන්තුවේ ස්ථිර කාර්ය මණ්ඩලය විසින් ආනයන හා අපනයන බලපත්‍ර නිකුත් කිරීම, හර කිරීම වැනි පරිපාලනමය කටයුතුද ආදායම් එක්රැස් කිරීම මෙන්ම ප්‍රතිපත්ති සම්පාදනය හා සම්බන්ධ කටයුතු ද ඉටු කරන ලදී (වගු අංක 1).

කාර්ය මණ්ඩලය මිත්‍රශීලී අයුරින් සේවාදායකයින්ට කාර්යක්ෂම හා ඵලදායී සේවයක් ලබා දෙමින් ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවට පැවරී ඇති කාර්යභාරය ප්‍රශස්ත අයුරින් ඉටු කිරීම පිණිස සාමූහික වගකීමෙන් යුතුව කැපවිණි.

දෙපාර්තමේන්තුව වෙළඳාම ආශ්‍රිත කටයුතුවල නිරත වෙමින් ආදායම් උත්පාදනයෙහි යෙදෙන නමුත් මෙහි පසුගිය වසර කිහිපය තුළම අභ්‍යන්තර විගණක නිලධාරියෙකු නොසිටීමේ අඩුවෙන් පෙළිණි. එම අඩුව සපුරාලමින් දෙපාර්තමේන්තුවට අභ්‍යන්තර විගණක නිලධාරියෙකු පත් කර එවන ලදී.

# 2018.12.31 දිනට කාර්ය මණ්ඩලය

| තනතුර | සේවය | ශ්‍රේණිය / පංතිය | වැටුප් කේතය | සේවා මට්ටම | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු වෙන් අනුමත සේවක සංඛ්‍යාව | | | දැනට සිටින සේවක සංඛ්‍යාව | | | | 2018.01.01 සිට 2018.12.31 දක්වා කාල පරිච්ඡේදය තුළ | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ස්ථිර | කොන්ත්‍රාත් | අනියම් | ස්ථිර | කොන්ත්‍රාත් | අනියම් | වෙනත් (බැඳ බලන) | බඳවා ගැනීම | උසස් කිරීම | ද්විතීයකයන් | ඉල්ලා අස්වීම | සේවය අත්හැර යෑම | සේවයෙන් පහ කිරීම | විශ්‍රාම ගැනීම | මියයාම |
| ආනයන හා අපනයන පාලක ජනරාල් | ශ්‍රී ලං.ප. සේ. | විශේෂ | SL3 - 2016 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 0 | 0 | 1 | 0 | 0 | | | | | | | | | |
| ආනයන හා අපනයන පාලක | ශ්‍රී ලං.ප. සේ. | I | SL1 - 2016 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 2 | 0 | 0 | 1 | 0 | 0 | | | | | | | | | |
| නියෝජ්‍ය / සහකාර පාලක | ශ්‍රී ලං.ප. සේ. | II/III | SL1 - 2016 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 6 | 0 | 0 | 5 | 0 | 0 | | | | | | | | | |
| ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී ලං.ග.සේ. | I | SL1 - 2016 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 0 | 0 | 1 | 0 | 0 | | | | | | | | | |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී ලං.ග.සේ. | I | SL1 - 2016 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 0 | 0 | 1 | 0 | 0 | | | | | | | | | |
| නීති නිලධාරී | | II/III | SL1 - 2016 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 0 | 0 | 0 | 0 | 0 | | | | | | | | | |
| පරිපාලන නිලධාරී | රා.ක.ස | අධිශ්‍රේණිය | MN7 - 2016 | තෘතීයික මට්ටම | 1 | 0 | 0 | 1 | 0 | 0 | | | | | | | | | |

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භාෂා පරිවර්තක | ර.භා.ප.සේ. | I/II | MN6 - 2016 | තෘතියික මට්ටම | 2 | 0 | 0 | 1 | 0 | 0 | | | | | | | | | |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | ශ්‍රී ලං.තො. හා තා.සේ. | II | MN6 - 2016 | තෘතියික මට්ටම | 1 | 0 | 0 | 1 | 0 | 0 | | | | | | | | | |
| | | III | MT1 - 2016 | ද්විතියික මට්ටම | 1 | 0 | 0 | 1 | 0 | 0 | මෙම වසරේදී මාර්ගගත පරිගණක පද්ධතිය දියත් කිරීම හේතුවෙන් නිලධාරීන් 3දෙනෙකු සඳහා මු.රෙ. 71 යටතේ අනුමැතිය ලබා ගැනීම පිණිස යවා ඇත. | | | | | | | | |
| අයවැය සහකාර | දෙපාර්තමේන්තු | - | MN4 - 2016 | ද්විතියික මට්ටම | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | | | | | | | | |
| දත්ත කළමනාකරණ සහකාර | දෙපාර්තමේන්තු | - | MN4 - 2016 | ද්විතියික මට්ටම | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | | | | | | | | |
| විමර්ශන නිලධාරි | දෙපාර්තමේන්තු | - | MN4 - 2016 | ද්විතියික මට්ටම | 2 | 0 | 0 | 2 | 0 | 0 | | | | | | 1 | | | |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| තොරතුරු හා තාක්ෂණ සහකාර | දෙපාර්තමේන්තු | - | MN4 - 2016 | ද්විතියික මට්ටම | 1 | 0 | 0 | 0 | 0 | 0 | මෙම නිලධාරීන් 3දෙනා සංවර්ධන නිලධාරි සේවයේ සංවර්ධන නිලධාරීන් ලෙස අන්තර්ග්‍රහණය කර ඇති අතර සංවර්ධන නිලධාරීන් 8දෙනෙකු සඳහා සේවක සංඛ්‍යාව වැඩි කිරීමට මු.රෙ. 71 යටතේ ඉල්ලීම් කර ඇත. ඒ අනුව සංවර්ධන නිලධාරි තනතුරු 1ක් අතිරික්තව ඇත | | | | | | | | |
| ප්‍රතිපත්ති හා සැලසුම් සහකාර | දෙපාර්තමේන්තු | - | MN4 - 2016 | ද්විතියික මට්ටම | 1 | 0 | 0 | 0 | 0 | 0 | | | | | | | | | |
| පර්යේෂණ සහකාර | දෙපාර්තමේන්තු | - | MN4 - 2016 | ද්විතියික මට්ටම | 1 | 0 | 0 | 0 | 0 | 0 | | | | | | | | | |
| සංවර්ධන නිලධාරි | සං.නි.සේ. | I/II/III | MN4 - 2016 | ද්විතියික මට්ටම | 4 | 0 | 0 | 9 | 0 | 0 | | | | | | | | | |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.ක.ස.සේ. | I/II/III | MN2 - 2016 | ද්විතියික මට්ටම | 57 | 0 | 0 | 45 | 0 | 0 | | | | | | | | 1 | |
| රියදුරු | රි.සේ. | I/II/III | PL3 - 2016 | මූලික මට්ටම | 5 | 0 | 0 | 4 | 0 | 0 | | | | | | | | | |
| කාර්යාල කාර්ය සහායක | කා.සේ.සේ. | I/II/III | PL1 - 2016 | මූලික මට්ටම | 15 | 0 | 0 | 7 | 0 | 0 | | | | | | | | | |
| **එකතුව** | | | | | 105 | 0 | 0 | 81 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 0 |

වගු අංක 1

# 2018.12.31 දිනට කාර්ය මණ්ඩල සාරාංශය

දෙපාර්තමේන්තු සේවයේ නිලධාරීන් තිදෙනෙකු සංවර්ධන නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය කර ඇත.

| අංකය | තනතුර, සේවය හා ශ්‍රේණිය | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | හිඟ සේවක සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | මාණ්ඩලික ශ්‍රේණිය | 12 | 09 | 03 | |
| 02 | තෘතියික ශ්‍රේණිය | 04 | 03 | 01 | |
| 03 | මාණ්ඩලික නොවන ශ්‍රේණිය | 69 | 58 | 11 | 02 |
| 04 | මූලික ශ්‍රේණිය | 20 | 11 | 09 | |
| | **එකතුව** | **105** | **81** | **24** | |

# තොරතුරු තාක්ෂණය සහ කළමනාකරණය



නව තොරතුරු තාක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා කටයුතු සම්පාදනය කිරීම 2018 වර්ෂයේදී නිම කෙරිණි.

දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ ඒකකය ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන ඒජන්සිය (ICTA) සමග එක්ව මංගත බලපත්‍ර නිකුත් කිරීමේ සහ හර කිරීමේ ක්‍රමය වැඩිදියුණු කරන ලදී.

- ✓ මංගතව බලපත්‍ර සඳහා අයදුම් පත්‍ර ඉදිරිපත් කිරීමේ අවස්ථාව සලසා දෙමින් මංගත ක්‍රමයේ පළමු අදියර දියත් කරන ලදී.

එයට අමතරව, මෙම ක්‍රමයේ ක්‍රියාකාරීත්වය පුළුල් කිරීම පිණිස පහත ක්‍රියාමාර්ග ගන්නා ලදී.

නව තොරතුරු තාක්ෂණ ක්‍රමය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය පුහුණු කිරීම

මංගත ක්‍රමයේ පළමු අදියර ආරම්භ කළ පසු මංගතව නිර්දේශ ලබාදීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම පිණිස නිර්දේශ කරන ආයතන සම්බන්ධ කර ගැනීම සඳහා එම ආයතන සමග රැස්වීම් 3ක් පවත්වන ලදී. ජාතික ඕසෝන් ඒකකය, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, ඛනිජ තෙල් අමාත්‍යාංශය, ජාතික ඖෂධ නියාමන අධිකාරිය, පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් සහ සුරාබදු දෙපාර්තමේන්තුව මෙම රැස්වීම් නියෝජනය කරන ලදී.

බලපත්‍ර නිකුත් කිරීමේ සහ හර කිරීමේ ක්‍රමය කළමනාකරණය සහ විධිමත් කිරීම නව මංගත ක්‍රමයට අදාළ නඩත්තු කිරීම්, වැඩිදියුණු කිරීම් සහ දෝෂ නිවැරදි කිරීම් දෘඩාංග (bug fixing hardware) ආනයන හා අපනයන පාලන තොරතුරු අඩවිය http://www.imexport.gov.lk පාර්ශ්වකරුවන්ගේ සහ මහජනයාගේ අවශ්‍යතා සපුරාලීම පිණිස වැඩිදියුණු කරන ලදී.

ශ්‍රී ලංකා වෙළඳ තොරතුරු බිහිදොර ශ්‍රී ලංකාවේ ආනයන සහ අපනයන කටයුතු සම්බන්ධ තොරතුරු එක් ස්ථානයකින්ම ලබාගත හැකි පහසුව සලසන්නකි. වෙළඳ දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යන මෙම තොරතුරු බිහිදොර වෙළඳ ප්‍රජාවට අපනයන, ආනයන සහ රටක් හරහා භාණ්ඩ ගෙනයෑමේ කටයුතු සම්බන්ධ නියාමන සහ ක්‍රියාපටිපාටි පිළිබඳ වැදගත් තොරතුරු ලබා ගැනීමට උපකාරී වන පහසුවෙන් ප්‍රවේශ විය හැකි මගකි. මෙය, වෙළඳ කටයුතුවලට අදාළව මෙරට පවතින නීති සහ ක්‍රියාවලීන්හි ඉදිරිය පුරෝකථනය කිරීමේදී සහ ඒවායෙහි විනිවිදභාවය වැඩිදියුණු කිරීමේදී සිය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා රජයට වැදගත් වන පියවරකි. ශ්‍රී ලංකා වෙළඳ තොරතුරු බිහිදොර වෙත සෘජුව පිවිසීම සඳහා දෙපාර්තමේන්තුවේ නිල තොරතුරු අඩවිය තුළින් සබැඳියක් මතු කර පෙන්වනු ලැබේ.

බලපත්‍ර ක්‍රියාවලිය සහ එම ක්‍රියාවලිය හා සම්බන්ධ ආනයන හා අපනයන විධිවිධානවලට අදාළ පොදු මාර්ගෝපදේශ ලංකා වෙළඳ තොරතුරු බිහිදොර තුළ දැක්වෙන අතර එහි තොරතුරු දෙපාර්තමේන්තුවේ අවසරය ඇතිව යාවත්කාලීන කරනු ලැබේ.

# පුහුණුව සහ හැකියා වර්ධනය

2018 වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ සියලුම මට්ටම්වල නිලධාරීන් දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු කාර්යක්ෂම හා ඵලදායී අයුරින් කරගෙන යාමට ඉවහල් වනු පිණිස ඔවුන්ගේ දැනුම, නිපුණතා සහ ආකල්ප වැඩිදියුණු කිරීම සඳහා පහත සඳහන් අයුරින් දේශීය හා විදේශීය පුහුණුව සඳහා යොමු කරන ලදී.

## පුහුණු වැඩසටහන්

දේශීය පුහුණුව - සංවර්ධන නිලධාරි, රාජ්‍ය කළමනාකරණ සහකාර, කාර්යාල කාර්ය සහායක

| අංකය | ආයතනය | පුහුණු වැඩසටහනෙහි තේමාව | සහභාගී වූ සංඛ්‍යාව | දිනය | වියදම් කළ මුදල |
|---|---|---|---|---|---|
| 1 | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය | වෙනස් කිරීම් කළමනාකරණය (Change Management) | 1 | 12/6/2018 | 5,000/- |
| 2 | මිලෝදා ආයතනය | වාර්තා ලිවීමේ හැකියාව | 1 | 19/06/2018 - 20/06/2018 | 13,000/- |
| 3 | ශ්‍රී ලංකා පදනම | ඉදිරිපත් කිරීමේ හැකියාව පිළිබඳ දෙදින වැඩමුළුව | 1 | 21/06/2018 - 22/06/2018 | 7,500/- |
| 4 | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | මොන්ට්‍රියෙල් සම්මුති ක්‍රමය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 60 | 7/7/2018 | 246,000/- |
| 5 | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - චීනය | ව්‍යාපාර සංස්කෘති හුවමාරුව සහ එය ශ්‍රී ලංකාව සඳහා ඒකාබද්ධ කර ගැනීම පිළිබඳ සම්මන්ත්‍රණය 2018 | 1 | 29/07/2018 - 27/08/2018 | – |
| 5 | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය | වෘත්තීය සෞඛ්‍යය සහ සුරක්ෂිතතා කළමනාකරණය | 2 | 07/08/18 | 10,000/- |
| 6 | මිලෝදා | සමීක්ෂණ මණ්ඩලය සහ පාඩු හා කපා හැරීම් | 2 | 30/08/2018 - 31/08/2018 | 26,000/- |
| 7 | නිපුණතා සංවර්ධන අරමුදල | කාර්යාල කාර්ය සහායකයින් සඳහා පුහුණුව | 1 | 20/09/2018- 21/09/2018 | 6,000/- |
| 8 | නිපුණතා සංවර්ධන අරමුදල | රියදුරන්ගේ රැකියාවට අදාළ දැනුම සහ ආකල්ප වැඩි දියුණු කිරීම | 1 | 28/09/2018- 29/08/2018 | 8,500/- |
| 9 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | වාහන සහ යන්ත්‍රසූත්‍ර | 1 | 18/10/2018 - 19/10/2018 | 7,000/- |
| 10 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | ආනයන හා අපනයන ක්‍රියා පටිපාටිය සහ ප්‍රතිපත්තිවලට අදාළ විෂයානුබද්ධ පුහුණුව | 53 | 20/10/2018 | 123,600/- |
| 11 | ශ්‍රී ලංකා පදනම | ආතතිය කළමනාකරණය කිරීමේ එක් දින වැඩමුළුව | 5 | 18/12/2018 | 17,500/- |

**දේශීය පුහුණුව - මාණ්ඩලික ශ්‍රේණිය**

| අංකය | ආයතනය | පුහුණු වැඩසටහනෙහි තේමාව | සහභාගී වූ සංඛ්‍යාව | දිනය | වියදම් කළ මුදල |
|---|---|---|---|---|---|
| 1 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | කථන කලාව පිළිබඳ පුහුණුව | 1 | 16/10/2018 සිට - දින 10 | 15,000/- |
| 2 | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය-චීනය | ව්‍යාපාර සංස්කෘති හුවමාරුව සහ එය ශ්‍රී ලංකාව සඳහා ඒකාබද්ධ කර ගැනීම පිළිබඳ සම්මන්ත්‍රණය 2018 | 2 | 29/07/2018 සිට 27/08/2018 දක්වා | – |
| 3 | ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මධ්‍යස්ථානය | ඉ-රාජ්‍ය සංකල්පය, සයිබර් සුරක්ෂිතතාව සහ මාධ්‍ය පිළිබඳ සම්මන්ත්‍රණය | 1 | 16/10/2018 | 2,000/- |
| 4 | ජාතික විගණන කාර්යාලය | ජාතික කාර්යාලය සමාරම්භනය කිරීම සහ ජාතික විගණන පනත පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 3 | 1/11/2018 | – |
| 5 | ප්‍රාග් ආයතනය (PRAG Institute) | ජාතික විගණන පනත | 1 | 30/10/2018 | 7,000/- |

**වගු අංක** 04

## විදේශ පුහුණුව - මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් සහ සංවර්ධන නිලධාරීන්

| අංකය | ආයතනය | පුහුණු වැඩසටහනෙහි තේමාව | සහභාගී වූ සංඛ්‍යාව | දිනය සහ කාල සීමාව |
|---|---|---|---|---|
| 1 | ජපානය | 25 වන ආසියානු අපනයන පාලන සම්මන්ත්‍රණය | 2 | 27/02/2018 සිට 01/03/2018 දක්වා |
| 2 | ඉන්දියාව | රජය හරහා ගෝලීය සැපයුම් දාමය සුරක්ෂිත කිරීම - එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනාව 1540 ඵලදායී අයුරින් ක්‍රියාත්මක කිරීම උදෙසා රජය-කර්මාන්ත හවුල් හරහා ගෝලීය සැපයුම් දාමය සුරක්ෂිත කිරීම | 1 | 16/04/2018 සිට 17/04/2018 දක්වා |
| 3 | චීනය | සංවර්ධනය වන රටවල් සඳහා ප්‍රවේශ පිටවුම් ලේඛන පරීක්ෂාව පිළිබඳ සම්මන්ත්‍රණය 2018 | 2 | 21/05/2018 සිට 10/06/2018 දක්වා |
| 4 | ඉන්දියාව | ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව කරා යෑම | 1 | 12/06/2018 සිට 31/08/2018 දක්වා |
| 5 | චීනය | සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා අන්තර් රාජ්‍ය ඉ- ව්‍යාපාර පිළිබඳ සම්මන්ත්‍රණය 2018 | 1 | 05/07/2018 සිට 25/07/2018 දක්වා |
| 6 | ඕස්ට්‍රේලියාව | වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ අංශය තුළ ශ්‍රී ලංකා - ඕස්ට්‍රේලියා සහයෝගීතාව ශක්තිමත් කිරීම සඳහා ඕස්ට්‍රේලියාව වෙත ජාතික වෙළඳ පහසුකම් සැපයීමේ කමිටු චාරිකාව: ජාතික වෙළඳ පහසුකම් සැපයීමේ කමිටු සාමාජිකයින් අතර ඉහළ මට්ටමේ සාකච්ඡා | 1 | 25/08/2018 සිට 02/09/2018 දක්වා |
| 7 | ඕස්ට්‍රේලියාව | කාන්තා විධායක නායකත්ව සංවර්ධන වැඩසටහන | 1 | 17/09/2018 සිට 05/10/2018 දක්වා |
| 8 | එක්සත් ජනපදය | අන්තර්ජාතික අවි ව්‍යාප්තිය සහ තර්ජනය පිළිබඳ පුහුණුව | 1 | 15/10/2018 සිට 26/10/2018 දක්වා |

**වගු අංක 05**

# දැනුවත් කිරීමේ වැඩසටහන්

## ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන

ආනයන සහ අපනයන ක්‍රියාපටිපාටි සහ ප්‍රතිපත්ති මෙන්ම කාර්යාල ක්‍රමය ද පිළිබඳව කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම පිණිස සැසි දෙකකින් යුතු එක් දින වැඩසටහනක් සංවිධානය කර ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේදී පැවැත්විණි.

පළමු සැසිය: ආනයන සහ අපනයන ක්‍රියාපටිපාටි සහ ප්‍රතිපත්ති සම්බන්ධ විෂය කරුණු - ශ්‍රී ලංකා රේගුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු වන අචල චන්ද්‍රසේකර මහතා විසින් මෙම සැසිය දෙපාර්තමේන්තුවේ එදිනෙදා කටයුතු හා සම්බන්ධ ගැටලු විසඳා ගැනීමට උපකාරී වන නිදසුන් දක්වමින් අන්‍යෝන්‍ය වශයෙන් අදහස් හුවමාරු කර කර ගැනීමේ ක්‍රමයට පවත්වන ලදී.

දෙවන සැසිය: කාර්යාල ක්‍රම - මෙය කාර්යාල ක්‍රමය තුළ ලේඛනගත කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම පිණිස සැලසුම් කරන ලද සැසියකි. මෙහිදී, රජයේ ආයතනවල වාර්තා ලිවීම, ලිපි ලිවීම සහ පොදු ලේඛන පිළිබඳ ක්‍රියාපටිපාටි පිළිබඳව පුළුල්ව සාකච්ඡා කරන ලදී.

## මොන්ට්‍රියල් සම්මුතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව ඕසෝන් ස්තරය, එම ස්තරය හානිවීමට බලපාන හේතුසාධක සහ ඕසෝන් ස්තරය රැක ගැනීමෙහිලා දෙපාර්තමේන්තුවේ කාර්යභාරය පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීම පිණිස වැඩමුළුවක් පවත්වන ලදී. එයට අමතරව, මෙම වැඩසටහන සේවකයින්ගේ ආකල්ප, නායකත්ව හැකියාවන් සහ තරඟකාරී වෘත්තීය ජීවිතය තුළ පෞද්ගලික ජීවිතය තෘප්තිමත් අයුරින් ගොඩ නැංවීමට ඉවහල් වන අයුරින් සැලසුම් කෙරිණි. මෙය ස්වයං වර්ධනය සම්බන්ධයෙන් වඩා පූර්ව විචාරීව කටයුතු කිරීම, මනා වෘත්තීය පාලනය, අභිමතාර්ථ ජය ගැනීම උදෙසා ස්වයං වර්ධනය අභිප්‍රේරකයක් වශයෙන් යොදා ගැනීම, වෘත්තීය වැඩිදියුණුව උදෙසා සේවා යෝජක සමග සක්‍රීය හවුලකට එළඹීම, වත්මන් සේවා ස්ථානයට ගැලපෙන අයුරින් නැවත හැඩ ගැසීම, වෙනස් කිරීම කළමනාකරණය කිරීම උදෙසා හැකියාව පුළුල් කිරීම, අවදානම් ගැනීම, සහයෝගයෙන් කටයුතු කිරීම සහ හවුල් හා කණ්ඩායම් ගොඩ නැංවීම පිණිස සේවකයින්ට උපකාරී විණි.

## ජාතික විගණන පනත පිළිබඳ දේශනය

ශ්‍රී ලංකා ජාතික විගණන කාර්යාලය සමග සහයෝගයෙන් 2018 අංක 19 දරන ජාතික විගණන පනත සම්බන්ධයෙන් නිලධාරීන් දැනුවත් කිරීම පිණිස දෙපාර්තමේන්තුව විසින් දේශනයක් සංවිධානය කරන ලදී. රාජ්‍ය සේවකයින් අතර මූල්‍යමය වගවීම ප්‍රවර්ධනය කිරීම පිණිස නෛතික රාමුවක් හඳුන්වා දීම වැදගත්ය. මෙම දේශනයේදී පනතේ ප්‍රභවය, වගන්ති සහ භාවිතය පැහැදිලි කෙරිණි. රාජ්‍ය ආයතනවල විගණන ක්‍රියාපටිපාටි පිළිබඳව දැනුවත්වීමේදී මෙය දෙපාර්තමේන්තුවට විශේෂිත දේශනයක් විය.

## අන්තර්ජාතික වෙළඳාම පිළිබඳව දැනුවත් වීම.

මෙම වැඩසටහන අන්තර්ජාතික වෙළඳාම තුළ වාණිජ බැංකුවක කාර්යභාරය සහ නියාමන ආයතනයක වැදගත්කම හඳුන්වා දෙනු පිණිස පවත්වන ලදී. මෙයට ශ්‍රී ලංකා ස්ටෑන්ඩඩ් චාර්ටඩ් බැංකුව සම්පත්දායකයින් වශයෙන් සහභාගී විය. මෙහිදී, අන්තර් ජාතික වෙළඳාමේ භාවිත වන ගෙවීම් ක්‍රම, රක්ෂණ ක්‍රම සහ විධිවිධාන සවිස්තරාත්මකව සාකච්ඡා කරන ලදී. ගනුදෙනුකරුවන්ගේ තෘප්තිය සහ ඵලදායිතාව ඉහළ නැංවීම පිණිස යම් යම් යෝජනා ක්‍රියාත්මක කිරීමටද යෝජනා විණි.

# සුභසාධනය

දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සුභසාධනය උදෙසා සුභසාධක සංගමයක් ස්ථාපිත කර ඇත. ඒ යටතේ පුස්තකාලයක් නඩත්තු කරනු ලැබේ. 2018 වර්ෂයේදී, නව ග්‍රන්ථ සහ නව අංග කිහිපයක් එක් කිරීමෙන් පුස්තකාලය වැඩිදියුණු කරන ලදී. මෙය කාර්ය මණ්ඩලයට තම දැනුම යථාවත් කර ගැනීමට සහ තම විවේක කාලය ප්‍රයෝජනවත් අයුරින් ගත කිරීමට උපකාරී වන අතර පොත් මිලදී ගනු වෙනුවට සෑම සේවකයෙකුටම එම ග්‍රන්ථ පරිශීලනය කිරීමේ හැකියාව උදාකර දී ඇත.

දෙපාර්තමේන්තු සේවකයින්ගේ වෙහෙස සමනය කිරීම පිණිස වාර්ෂික සුහද හමුවක් සංවිධානය කරන ලද අතර එය ඔවුන්ගේ ආතතිය අඩුකර සහෝදර සේවකයින් සමග කාලය ගත කරමින් ඔවුන්ව දැන හඳුනා ගැනීමට කාර්යාලයෙන් බැහැරව ඉඩකඩ සලසා දුන් අනගි අවස්ථාවක් විය.

# යටිතල පහසුකම් සංවර්ධනය

කාර්යාලය යනු සේවකයින් තම ජීවිතයේ වැඩිම කාලයක් එනම් බිත්ති හතරක යටිතල පහසුකම් අතර දිනකට පැය අටක නවයක කාලයක් ගත කරන ස්ථානයයි. එහෙයින් පවතින මෙම යටිතල පහසුකම් යටතේ වැඩිම බලපෑමට ලක්වන ආයතනයේ විශාලතම සම්පත වන කාර්ය මඩුල්ල කෙරෙහි අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. කාර්යාල බිමෙහි සමහර කොටස් දෙපාර්තමේන්තුවෙහි පහසුකම් හා ඉඩකඩ පුළුල් කිරීම පිණිස නවීකරණය කරන ලදී. වඩා සේවක හිතකාමී පහසුකම් ස්ථාපිත කිරීම ආරම්භ කර ඇත. මෙම සංවර්ධන ක්‍රියාදාමය තුළින් දෙපාර්තමේන්තුව තම සේවකයින්ගේ ඵලදායිතාව වර්ධනය කිරීමත් සේවය වැඩි ලාභ උපයන්නක් බවට පත් කිරීමත් සේවා ස්ථානයේ සමගිය සහ ශාන්තබව වැඩි කර ආතතිය අඩු කිරීමත් අපේක්ෂා කෙරේ.

# 2018 වර්ෂය තුළ ප්‍රකාශයට පත් කරන ලද නව විධිවිධාන

ආනයන සහ අපනයන සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිණිස අදාළ විධිවිධාන ප්‍රකාශයට පත් කර බලාත්මක කිරීම සඳහා පහත සඳහන් අති විශේෂ ගැසට් නිවේදන ප්‍රකාශයට පත් කරන ලදී.

| අති විශේෂ ගැසට් නිවේදන අංකය | දිනය | විස්තරය |
|---|---|---|
| 2064/34 | 29.03.2018 | ආනයන සහ අපනයන විධිවිධාන (ප්‍රමිතිකරණය සහ තත්ත්ව පාලනය) |
| 2076/4 | 18.06.2018 | ග්ලයිෆොසේට් ආනයනය පිළිබඳව පනවන ලද තහනම ඉවත් කිරීම |
| 2079/70 | 13.07.2018 | වාහන වායු විමෝචන ප්‍රමිති සහ ආරක්ෂිත මිනුම් |
| 2083/37 | 10.08.2018 | වාහන වායු විමෝචන ප්‍රමිති සහ ආරක්ෂිත මිනුම් |

**වගු අංක** 06

## ආනයන සහ අපනයන විධිවිධාන (ප්‍රමිතිකරණය සහ තත්ත්ව පාලනය)

ශ්‍රී ලංකාව 1968 වර්ෂයේ සිට ලෝක රේගු සංවිධානයේ සාමාජික රටක් වන අතර සංයෝජිත භාණ්ඩ විස්තරය සහ සංකේතාංක ක්‍රමය පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය ක්‍රියාත්මක කිරීමට බැඳී සිටී. එම සම්මුතියේ 3වන වගන්තිය ප්‍රකාරව, රේගු බදු සහ සංඛ්‍යානමය නාමකරණය සංයෝජිත ක්‍රමයට අනුකූල විය යුතුය. සංයෝජිත ක්‍රමය සෑම වසර 4කටම වරක් සංශෝධනය කරනු ලැබේ. ඒ අනුව, 2012 සංයෝජිත ක්‍රමය 2017 සංයෝජිත ක්‍රමය වශයෙන් සංශෝධනය කර ඇත.

තාක්ෂණයේ සහ අන්තර්ජාතික වෙළඳාම් රටාවන්හි වෙනස්කම් හමුවේ සංයෝජිත ක්‍රමය යථාවත් වීම සහතික කරනු පිණිස එය නව වෙළුමක් (2017) වශයෙන් සම්මත කරගෙන ඇත. කෘෂිකාර්මික, රසායනික, දැව, රෙදිපිළි, මූල ලෝහ, යන්ත්‍රසූත්‍ර, ප්‍රවාහන සහ වෙනත් ක්ෂේත්‍ර කිහිපයක් ආවරණය කරමින් මෙම සංශෝධන සිදු කර ඇත.

ලෝක රේගු සංවිධානයට ඇති බැඳීම්වලට අනුකූලවීම පිණිස ශ්‍රී ලංකාව පවතින ජාතික සංයෝජිත ක්‍රමයට අංක අටේ මට්ටමින් සංශෝධන එක් කරන ලදී. සංයෝජිත භාණ්ඩ පිළිබඳ අන්තර් ජාතික සම්මුතියේ 3වන වගන්තිය ප්‍රකාරව, ආදායම් ආරක්ෂණ නියෝගය අනුව මෙම සංශෝධන ප්‍රකාශයට පත් කර ඇත.

ඒ අතරම, සංශෝධිත සංයෝජිත වර්ගීකරණ සංකේතාංක අනුව ආනයන සහ අපනයන පාලන විධිවිධාන (ප්‍රමිතිකරණය සහ තත්ත්ව පාලනය) සංශෝධනය කිරීමක් අවශ්‍ය වූ අතර ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නව ප්‍රමිති හඳුන්වා දී ඒ අනුව අංක 2064/34 සහ 2018 මාර්තු 29 දින දරන ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කරන ලදී.

## ග්ලයිෆොසේට් ආනයනය මත පැනවූ තහනම ඉවත් කිරීම

ග්ලයිෆොසේට් මගින් ඇති කරන සෞඛ්‍යමය ගැටළු මත මෙම තහනම පදනම් විය. ග්ලයිෆොසේට් ආනයනය මත පැනවූ තහනම මෙරට තේ, රබර් සහ පොල් වැනි ආර්ථික බෝගවල නිෂ්පාදන පිරිවැය ඉහළ යාමට සෘජුව බලපෑ බව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය දිගින් දිගටම පෙන්වා දුණි. අතිගරු ජනාධිපතිතුමන් විසින් පත් කරන ලද කමිටුව එහි නිර්දේශ ප්‍රකාරව තහනම ඉවත් කිරීමට නිර්දේශ කරන ලද අතර ඉන්පසු ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව අමාත්‍ය මණ්ඩලය තේ සහ රබර් වගා අංශ සඳහා මාස 36ක කාලයකට තහනම ඉවත් කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව, මාස 36ක කාලයක් සඳහා තහනම ඉවත් කිරීම පිණිස අංක 2076/4 සහ 2018.06.18 දිනැති ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කරන ලදී.

## වාහන වායු විමෝචන ප්‍රමිති සහ ආරක්ෂණ මිනුම්

වාහනවල ප්‍රමාණවත් ආරක්ෂණ මිනුම් සහ ප්‍රමිති නොතිබීම මාරාන්තික රිය අනතුරු, බරපතල තුවාළ සහ හානි ඇතිවීමට දායක වන ප්‍රධානතම සාධකය බවට පත්වී ඇති අතර 2016 වසරට සාපේක්ෂව 2017 වසර තුළ එවන් අනතුරු හා හානි සිදුවීම් සැලකිය යුතු අයුරින් ඉහළ ගොස් ඇත. රථ වාහන පාලනය සහ මාර්ග ආරක්ෂාව පිළිබඳ අංශය විසින් සපයන ලද සංඛ්‍යා ලේඛන අනුව, 2017 වසරේ මාරාන්තික රිය අනතුරු ප්‍රමාණය 5.6% කින් ඉහළ ගොස් ඇති අතර බරපතළ තුවාළ සිදුවූ සංඛ්‍යාව 14,453ක් වශයෙන් වාර්තා වී ඇත.

| වර්ෂය | අනතුරු කාණ්ඩය | | | |
|---|---|---|---|---|
| | මාරාන්තික | බරපතළ තුවාළ | බරපතළ නොවන තුවාළ | හානි පමණක් සිදුවීම |
| 2017 | 4,517 | 14, 453 | 21, 741 | 23,977 |
| 2016 | 4,276 | 14,760 | 23,135 | 24,799 |

වගු අංක 07 (රථ වාහන පාලන සහ මාර්ග ආරක්ෂාව පිළිබඳ අංශය විසින් සපයන ලද සංඛ්‍යා ලේඛන)

මාර්ග අනතුරු හේතුවෙන් ජීවිත හා දේපලවලට ඇති වන හානිය සැලකිල්ලට ගනිමින් මෝටර් වාහන සඳහා ආරක්ෂණ ප්‍රමිති / මිනුම් හඳුන්වා දී ප්‍රති අගුළු තිරිංග පද්ධති, ආසන පටි සහ වායු බෑග අනිවාර්ය කළ යුතු බව 2018 අයවැය යෝජනා මගින් දක්වා ඇත.

මෝටර් වාහනවල සිදුවන ඉන්ධන දහනය මගින් වායුගෝලයට නයිට්‍රජන් ඔක්සයිඩ්, කාබන් මොනොක්සයිඩ් සහ වෙනත් දූෂණ කාරක විශාල ප්‍රමාණයක් එකතු වන අතර එයින් සිදුවන වායු දූෂණය හේතුවෙන් සෞඛ්‍යය කෙරෙහි බෙහෙවින් බලපතල අවදානමක් මතුවේ. වායුගෝලයේ තත්වය පිරිහීම හේතුවෙන් ඇදුම සහ ශ්වාසනාල ප්‍රදාහය වැනි ශ්වසන රෝග ඉහළ යන අතර පිළිකා වැනි ජීවිත අවදානමට තර්ජනයක් වන රෝග ඇතිවීමේ අවදානමද ඉහළ යයි. කාබන් දහනය නිසා වායුගෝලයට එකතුවන අංශුමය ද්‍රව්‍ය හේතුවෙන් වසරක් පාසා අකල් මරණ 30,000ක් පමණ ඇතිවේ. ශ්‍රී ලංකාව කාර්මීකරණය නොවූ රටක් නිසාවෙන් වාහන මගින් ඇතිවන වායු දූෂණය, කර්මාන්ත ශාලා සහ තාප විදුලි බලාගාර මගින් ඇතිවන වායු දූෂණයට වඩා වැඩි බව නිරීක්ෂණය කර ඇත. ඒ සම්බන්ධයෙන් පර්යේෂණ කරන විද්‍යාඥයින් විසින්ද එය තහවුරු කර ඇත. වාහන වායු විමෝචනය නාගරික වායු දූෂණය කෙරෙහි 60%කින් දායක වන හෙයින් වාහන මගින් ඇති කරන වායු දූෂණය අවම කිරීම අත්‍යවශ්‍ය වේ.

ඒ අනුව, මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය විසින් අංක 2079/42 සහ 2018.07.12 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාශයට පත්කර එහි උපලේඛනවල සඳහන් විමෝචන ප්‍රමිතිවලට අනුකූල වීම අනිවාර්ය කරන ලදී. එකී ගැසට් නිවේදනය සහ අයවැය යෝජනාවෙහි දැක්වෙන ආරක්ෂණ ප්‍රමිති / මිනුම් මත පදනම්ව, විමෝචන ප්‍රමිති සහ ආරක්ෂණ ප්‍රමිති / මිනුම්වලට අනුකූල වීමේ අවශ්‍යතාව ඇතුළත් කරමින් අංක 2079/70 සහ 2018.07.13 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කරන ලදී.

කෙසේවුවද, ජපානයේ නිෂ්පාදිත මෝටර් වාහන අංක 2079/42 සහ 2018.07.12 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනයේ ෂෂෂ වන උපලේඛනයේ සඳහන් වායු විමෝචන මට්ටමට අනුකූල නොවන බැවින් යථෝක්ත ගැසට් නිවේදනයට V වන උපලේඛනය ඇතුළත් කරමින් සංශෝධනය කර 2083/3 සහ 2018.08.06 දින දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරන ලදී. එයට අනුකූලව, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් අංක 2083/37 සහ 2018.08.10 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කිරීමට පියවර ගන්නා ලදී.

## ශ්‍රී ලංකාව තුළ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනාව -1540 ක්‍රියාවට නැංවීම

මෙම වැඩසටහනේ අරමුණ ශ්‍රී ලංකාවට උපායමාර්ගික වෙළඳ පාලන ක්‍රමයක් හඳුන්වාදීමයි. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනාව -1540 අන්තර්ජාතික සාමයට සහ ආරක්ෂාවට තර්ජනයක් වන න්‍යෂ්ටික, රසායනික සහ ජෛව විද්‍යාත්මක අවි ව්‍යාප්තිය මෙන්ම ඒවා යොමු කරන ක්‍රම සම්බන්ධයෙන් පවතින නෛතික බැඳීමක් වන එකඟතාවකි. එමනිසා සාමකාමී අරමුණු උදෙසා න්‍යෂ්ටික, රසායනික සහ ජෛව විද්‍යාත්මක අවි සම්බන්ධ ද්‍රව්‍ය අපනයනය, ප්‍රති-අපනයනය, සංක්‍රමණය හා නැව් මාරු කිරීමට අදාළ නීති සහ විධිවිධාන පැනවීමද යාන්ත්‍රණ ඇති කිරීමද අවශ්‍ය වේ. එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් යථෝක්ත බැඳීම් සපුරාලමින් සාම්ප්‍රදායික සහ සාම්ප්‍රදායික නොවන සමූල ඝාතක අවි නිෂ්පාදනය සඳහා මෙන්ම සාමාන්‍ය නිෂ්පාදන කටයුතු සඳහාද අවශ්‍ය වන අයතම සංසරණය සහ වෙළඳාම පාලනය කරන උපාය මාර්ගික අපනයන පාලන යාන්ත්‍රණයක් අනුගමනය කළ යුතුය. යථෝක්ත යෝජනාව අනුව, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව උපායමාර්ගික අපනයන පාලන ලැයිස්තුවක් සැකසීමේ සහ යථෝක්ත යෝජනාව අනුව පවත්නා අණ පනත් සංශෝධනය කිරීමේ හෝ නව අණ පනත් පැනවීමේ ශක්‍යතාව සොයා බැලීමේ මූලික කටයුතු ආරම්භ කර ඇත. මෙම වැඩසටහනේ අරමුණ සාක්ෂාත් කර ගැනීම උදෙසා උපාය මාර්ගික වෙළඳ පාලන ක්‍රමය පිළිබඳව දැනුවත් කිරීම පිණිස දෙපාර්තමේන්තුව රාජ්‍ය ආයතන සමග සහයෝගයෙන් රැස්වීම් සහ වැඩමුළු සංවිධානය කරමින් සිටී.

# පූර්ව නැව්ගත කිරීම් පරීක්ෂණ සහතිකය

ආනයන හා අපනයන පාලන විධිවිධාන අනුව, පාවිච්චි කළ වාහන ආනයනයේදී සහ අලුත් වාහන ආනයනයේදී නිෂ්පාදන සහතිකය ඉදිරිපත් කිරීමට සැපයුම්කරු අසමත් වන අවස්ථාවකදී පූර්ව නැව්ගත කිරීම් පරීක්ෂණ සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. වර්තමානයේදී, බලයලත් පරීක්ෂණ ආයතන 4ක් පූර්ව නැව්ගත කිරීම් පරීක්ෂණ සහතික නිකුත් කිරීමේ නියලී සිටින අතර කාර්යක්ෂමව සහ ආර්ථිකමය වශයෙන් වාසිදායක වන අයුරින් සේවාදායකයින්ට සේවය ලබාදීමට මග පාදනු වස් ආයතන අතර තරඟකාරීත්වයක් ඇති කිරීම පිණිස බලයලත් පරීක්ෂණ ආයතන සංඛ්‍යාව වැඩි කළ යුතුය. ඒ සඳහා තාක්ෂණික කමිටුවක් පත්කර බලයලත් පරීක්ෂණ ආයතන සංඛ්‍යාව වැඩි කිරීම පිණිස රැස්වීම් පවත්වන ලදී.

# ආදායම් විශ්ලේෂණය

2018 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව රු. මිලියන 1554ක ආදායමක් උපයා ගැනීමට සමත් විය. 2017 වර්ෂයට සාපේක්ෂව, ආදායම 4.5% කින් (රු. 66,720,762.80) වර්ධනය වී ඇති අතර එය පහත වගුවේ වර්ගීකරණය කර දැක්වේ.

| වර්ෂය | ආදායම රු. |
|---|---|
| 2017 | 1, 487,761,561.39 |
| 2018 | 1, 554,482,324.19 |

වගු අංක 8

යථෝක්ත ආදායම තුළ අමතර ගාස්තු සහ සංශෝධිත ගාස්තුද ඇතුළත් වේ.
ආදායමේ වර්ධනය කෙරෙහි විශේෂ හේතුවක් බල නොපෑ නමුදු නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව ඉහළ යාම සහ එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම එයට හේතුකාරක වන්නට ඇත.

# ආදායම

ආදායම පිළිබඳ විස්තර පහත වගුවේ දැක්වේ.

| මාසය | ශුද්ධ ආදායම |
|---|---|
| ජනවාරි | 185,720,231.94 |
| පෙබරවාරි | 112,577,468.99 |
| මාර්තු | 120,411,813.62 |
| අප්‍රේල් | 99,006,540.82 |
| මැයි | 113,007,887.79 |
| ජූනි | 130,531,188.22 |
| ජූලි | 96,974,612.16 |
| අගෝස්තු | 133,920,374.92 |
| සැප්තැම්බර් | 97,867,536.61 |
| ඔක්තෝබර් | 153,915,345.58 |
| නොවැම්බර් | 126,213,678.08 |
| දෙසැම්බර් | 184,335,645.46 |
| **එකතුව** | **1,554,482,324.19** |

වගු අංක 9

# වියදම් විශ්ලේෂණය

**මූලය ප්‍රභව**
ඒකාබද්ධ අරමුදල විසින් දේශීය අරමුදල් යටතේ වෙන් කර දෙන ලද ප්‍රතිපාදන ඵලදායී සහ කාර්යක්ෂම අයුරින්ය වැය කිරීමට පියවර ගෙන ඇත.

| විස්තරය | 2017 වර්ෂය | 2018 වර්ෂය |
|---|---|---|
| මුළු වියදම | 67,131,842.30 | 63,254,930.89 |

වගු අංක 10 (2018 වර්ෂයේ වියදම 5.78% කින් අඩුවී ඇත.)

# ආදායම් සහ වියදම් විශ්ලේෂණය

දෙපාර්තමේන්තුව රු. බිලියන 1.56ක ආදායමක් උපයා රු. මිලියන 63ක වියදමක් දැරීය. මාසික ආදායම් හා වියදම් සාරාංශය පහත වගුවේ දැක්වේ:

| මාසය | ආදායම රු. | වියදම රු. |
|---|---|---|
| ජනවාරි | 185,720,231.94 | 4,151,481.53 |
| පෙබරවාරි | 112,577,468.99 | 6,816,976.57 |
| මාර්තු | 120,411,813.62 | 4,281,015.20 |
| අප්‍රේල් | 99,006,540.82 | 5,564,055.30 |
| මැයි | 113,007,887.79 | 4,412,585.67 |
| ජුනි | 130,531,188.22 | 4,578,287.18 |
| ජූලි | 96,974,612.16 | 4,999,373.10 |
| අගෝස්තු | 133,920,374.92 | 5,063,144.85 |
| සැප්තැම්බර් | 97,867,536.61 | 4,672,972.99 |
| ඔක්තෝබර් | 153,915,345.58 | 4,872,480.66 |
| නොවැම්බර් | 126,213,678.08 | 6,254,413.01 |
| දෙසැම්බර් | 184,335,645.46 | 7,588,144.83 |
| **එකතුව** | **1,554,482,324.19** | **63,254,930.89** |

වගු අංක 11

## ආදායම් සහ වියදම් විශ්ලේෂණය - 2018




**සටහන 01**

# 2018 වර්ෂයේදී නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව (වර්ගීකරණය)

| අංකය | විස්තරය | කාණ්ඩය | බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|---|
| **1 වන ඒකකය - ඖෂධ** | | | |
| 1 | බටහිර ඖෂධ | 400 | 1,650.00 |
| 2 | පශු ඖෂධ | 410 | 336 |
| 3 | ආයුර්වේද ඖෂධ | 420 | 230 |
| 4 | හෝමියෝපති ඖෂධ | 430 | 12 |
| 5 | ශල්‍ය මැහුම් තන්තු | 450 | 65 |
| **උප එකතුව** | | | **2293** |
| **2 වන ඒකකය - වාහන** | | | |
| 6 | සමාජ සේවා ආයතන සඳහා පරිත්‍යාග | 150 | 10 |
| 7 | නේවාසික විදේශිකයින් | 160 | 1 |
| 8 | විශේෂ කාර්ය යන්ත්‍රසූත්‍ර | 180 | 26 |
| 9 | මෝටර් ට්‍රේලර් (පාවිච්චි කළ) | 185 | 1 |
| 10 | අපනයන ප්‍රවර්ධනය සඳහා තාවකාලික ආනයන කිරීම් | 190 | 1 |
| 11 | අවමංගල රථ | 200 | 1 |
| 12 | ගුවන් යානා සහ හෙළිකොප්ටර් අමතර කොටස් | 210 | 87 |
| 13 | එන්ජින් | 220 | 201 |

| | | | |
|---|---|---|---|
| 14 | කැබින් | 230 | 10 |
| 15 | බොඩි ෂෙල් | 235 | - |
| 16 | පාවිච්චි කළ මෝටර් බයිසිකල් | 240 | 25 |
| 17 | හෙල්මට් | 245 | 27 |
| 18 | රේගු වෙන්දේසිය | 255 | - |
| 19 | බර වාහන | 270 | 170 |
| 20 | බර වාහන (ණයවර ලිපි බලපත්‍ර) | 275 | 2 |
| 21 | වාහන අමතර කොටස් | 280 | 5 |
| 22 | ටයර් | 285 | 3 |
| 23 | චැසි | 290 | 18 |
| 24 | ස්වයංක්‍රීය ත්‍රීරෝද රථ | 305 | - |
| 25 | ආසන | 320 | 152 |
| **උප එකතුව** | | | **740** |
| **3 වන ඒකකය – රසායන ද්‍රව්‍ය** | | | |
| 26 | රසායන ද්‍රව්‍ය | 500 | 637 |
| 27 | ඛනිජ තෙල් නිෂ්පාදන | 510 | 1,036 |
| 28 | පළිබෝධනාශක | 520 | 1,584 |
| 29 | විකිරණශීලී ද්‍රව්‍ය | 530 | 161 |
| 30 | මධ්‍යසාර | 540 | 300 |
| **උප එකතුව** | | | **3718** |
| **4 වන ඒකකය - සන්නිවේදන උපකරණ සහ වෙනත්** | | | |
| 31 | පරිගණක | 625 | 5 |
| 32 | ශීතකරණ වායු | 640 | 31 |
| 33 | මුද්‍රණ යන්ත්‍ර සහ ඡායා පිටපත් යන්ත්‍ර | 690 | 171 |
| 34 | දුරස්ථ පාලකයකින් ක්‍රියා කරන සෙල්ලම් බඩු | 660 | 101 |
| 35 | සන්නිවේදන උපකරණ සහ ජංගම දුරකථන | 620 | 1,019.00 |
| 36 | පාවිච්චි කළ වායු සමීකරණ, පාවිච්චි කළ ශීතකරණ සහ අධි ශීතකරණ | 630 | 3 |
| 37 | පාවිච්චි කළ රෙදි සෝදන යන්ත්‍ර | 635 | 1 |
| 38 | කාලගුණ බැලූන | 695 | 1 |
| 39 | වායු සමීකරණ (අලුත්) | 645 | 97 |
| 40 | ජංගම දුරකථන (පාවිච්චි කළ / අලුත්) | 615 | 2,868.00 |
| 41 | තාප පොම්ප | 631 | 4 |
| 42 | විදුලි පේනු සහ කෙවෙනි | 655 | 9 |
| **උප එකතුව** | | | **4310** |

| 5 වන ඒකකය - වෙනත් ආනයන සහ අපනයන | | | |
|---|---|---|---|
| 43 | සතුන් සහ සත්ව නිෂ්පාදන | 550 | 1,970.00 |
| 44 | ශීත කළ මසුන් | 555 | 377 |
| 45 | ශීත කළ දැල්ලන් | 556 | 82 |
| 46 | තේ | 570 | 133 |
| 47 | කාසි | 610 | 5 |
| 48 | පුපුරණ ද්‍රව්‍ය හා ගිනි අවි | 600 | 137 |
| 49 | ලෝහ කැබලි හා සුන්බුන් සහ වෙනත් | 715 | 92 |
| 50 | අබලි ලෝහ සුන්බුන් | 710 | 390 |
| 51 | ශක්තිජනක පාන | 575 | 96 |
| 52 | දැවි තෙල් | 700 | 423 |
| 53 | පාවිච්චි කළ ඇඳුම් | 720 | 154 |
| 54 | ක්‍රීඩා භාණ්ඩ | 650 | 7 |
| 55 | ඉරන ලද දැව කොටස් | 602 | 51 |
| 56 | පාවිච්චි කළ ලී බඩු | 680 | 74 |
| 57 | තේ | 580 | 669 |
| 58 | කාබනික අපද්‍රව්‍ය | 735 | 6 |
| | | 670 | 48 |
| **උප එකතුව** | | | **4714** |
| **එකතුව** | | | **15,775** |

**වගු අංක 12**

# 2018 වර්ෂයේදී නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව

| මාසය | ඖෂධ | වාහන | රසායන ද්‍රව්‍ය | සන්නිවේදන උපකරණ | අපනයන | එකතුව |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | 226 | 65 | 298 | 389 | 360 | 1338 |
| පෙබරවාරි | 176 | 88 | 245 | 393 | 365 | 1267 |
| මාර්තු | 179 | 75 | 339 | 371 | 465 | 1429 |
| අප්‍රේල් | 154 | 81 | 266 | 257 | 328 | 1086 |
| මැයි | 199 | 73 | 321 | 402 | 369 | 1364 |
| ජූනි | 162 | 62 | 333 | 320 | 380 | 1257 |
| ජූලි | 186 | 62 | 342 | 349 | 398 | 1337 |
| අගෝස්තු | 220 | 54 | 337 | 406 | 443 | 1460 |
| සැප්තැම්බර් | 178 | 34 | 247 | 373 | 358 | 1190 |
| ඔක්තෝබර් | 211 | 60 | 374 | 340 | 462 | 1447 |
| නොවැම්බර් | 156 | 50 | 275 | 356 | 375 | 1212 |
| දෙසැම්බර් | 246 | 36 | 341 | 354 | 411 | 1388 |
| **එකතුව** | **2293** | **740** | **3718** | **4310** | **4714** | **15775** |



**වගු අංක 13**

# පසුගිය වසර 5 තුළ නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව

පසුගිය වසර 5 තුළ ඒ ඒ ඒකකය විසින් නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව පහත පරිදි වේ.

| අයිතමය | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| ඖෂධ | 2500 | 2732 | 2,450 | 2,205 | 2293 |
| වාහන | 958 | 739 | 797 | 690 | 740 |
| රසායන ද්‍රව්‍ය | 4339 | 3844 | 3,684 | 3,644 | 3718 |
| සන්නිවේදන උපකරණ | 3523 | 4338 | 4,399 | 3,401 | 4310 |
| වෙනත් ආනයන සහ අපනයන | 2148 | 3274 | 4,168 | 4,947 | 4714 |

වගු අංක 14

# පසුගිය වසර 5 තුළ නිකුත් කරන ලද බලපත්‍ර පිළිබඳ දත්ත සමාලෝචනය

## ඖෂධ - 1වන ඒකකය

පසුගිය වසර 5ක කාලය තුළ වැඩිම බලපත්‍ර සංඛ්‍යාවක් නිකුත් කරන ලද වර්ෂය වශයෙන් 2015 වර්ෂය වාර්තා ගත විය. 2016 වර්ෂයේ සිට නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව වාර්ෂිකව අඩුවූ අතර 2018 වර්ෂයේදී මඳ වර්ධනයක් පෙන්නුම් කරන ලදී. 1වන ඒකකය විසින් නිකුත් කරන ලද බලපත්‍ර අතර වැඩි වශයෙන්ම පැවතියේ බටහිර ඖෂධ සඳහා නිකුත් කළ බලපත්‍රය.

## වාහන - 2වන ඒකකය

2014-2016 කාල සීමාවට සාපේක්ෂව 2017 වර්ෂයේදී ආනයනය කළ වාහන සඳහා නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව පවා අඩුවී තිබුණු නමුත් 2018 වර්ෂයේදී එහි වර්ධනයක් වාර්තා විය. පසුගිය වර්ෂ 5 තුළ වාහන සඳහා ලබා දෙන ලද බලපත්‍ර සංඛ්‍යාවේ උච්චාවචනයක් දක්නට ලැබිණි.

## රසායන ද්‍රව්‍ය - 3වන ඒකකය

රසායන ද්‍රව්‍ය ආනයනය සඳහා වැඩිම බලපත්‍ර සංඛ්‍යාව නිකුත් කිරීම 2014 වර්ෂයේදී වාර්තා විය. 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාවේ අඩුවක් දක්නට ලැබිණි. 2018 වර්ෂයේදී 3වන ඒකකය විසින් වැඩිම බලපත්‍ර සංඛ්‍යාව ලබා දෙන ලද අයිතමය වූයේ පළිබෝධනාශකය. එය දිවයිනේ වගා කටයුතු සඳහා යොදා ගැනීම වෙනුවෙන් විය. පසුගිය වසර 4 තුළ ආර්ථිකයේ නිෂ්පාදන අංශය අඩු වර්ධනයක් පෙන්නුම් කළ අතර එය රසායන ද්‍රව්‍ය ආනයනය අඩු වීම කෙරෙහි බලපාන ලදී.

## සන්නිවේදන උපකරණ සහ වෙනත් - 4වන ඒකකය

2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා සන්නිවේදන උපකරණ ආනයනය සඳහා ලබා දෙන ලද බලපත්‍ර සංඛ්‍යාවේ අඛණ්ඩ වර්ධනයක් දක්නට ලැබිණි. 2017 වර්ෂයේදී මෙහි යම් අඩුවක් පැවතියද 2018 වර්ෂයේදී වර්ධනයක් පෙන්නුම් කරන ලදී. 2018 වර්ෂයේදී සිදුවූ සන්නිවේදන අංශයේ ව්‍යාප්තිය මෙම වර්ධනයට හේතු විය. ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එක්රැස්වීමට මග පෑදිය හැකි හෙයින් දෙපාර්තමේන්තුව විසින් පාවිච්චි කළ විදුලි සහ ඉලෙක්ට්‍රොනික අයතම ආනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම අඩු කළද සන්නිවේදන උපකරණ සහ වෙනත් උපකරණ සඳහා ලබා දෙන ලද බලපත්‍ර සංඛ්‍යාව වැඩිවී තිබිණි. මෙයට හේතුකාරක වූයේ මෙරට තුළ සිදුවූ තාක්ෂණයේ ව්‍යාප්තියයි.

## වෙනත් ආනයන සහ අපනයන - 5වන ඒකකය

2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වෙනත් ආනයන සහ අපනයන සඳහා ලබා දෙන ලද බලපත්‍ර සංඛ්‍යාවේ අඛණ්ඩ වර්ධනයක් වාර්තා වුවද 2018 වර්ෂයේදී තරමක අඩුවක් දක්නට ලැබිණි. වැඩිම බලපත්‍ර සංඛ්‍යාවක් නිකුත් කරන ලද්දේ සත්ව සහ සත්ව නිෂ්පාදන කාණ්ඩය යටතේය.




# සමාප්ති සටහන

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ ඉදිරි දැක්ම සහ මෙහෙවර ප්‍රකාරව මෙරට ආරක්ෂාව, ආර්ථිකය, මහජන සෞඛ්‍යය සහ පරිසරයට අදාළව රජය විසින් කලින් කලට ගනු ලබන ආනයන හා අපනයන ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීම පිණිස 2018 වර්ෂයේදී ගැසට් නිවේදන 4ක් ප්‍රකාශයට පත්කරන ලදී. වසර තුළ දෙපාර්තමේන්තුව විසින් ජාතික ආදායමට සැලකිය යුතු ආදායමක් එක් කරන ලදී. එමෙන්ම, මෙම දෙපාර්තමේන්තුව සේවාදායකයින් ඉහළ මට්ටමින් සෑහීමට පත් වන අයුරින් සහ ජාතික සංවර්ධන අරමුණු සාක්ෂාත් වන අයුරින් අන්තර්ජාතික වෙළඳ ප්‍රතිපත්තිවලට සහ නූතන ඉ-තාක්ෂණයන්ට අනුකූලව බලපත්‍ර නිකුත් කිරීමේ කාර්යය හා සේවා සැපයීම වැඩිදියුණු කිරීමේ ප්‍රයත්නයක නිරතව සිටී.

## ඇමුණුම - සංවිධාන සටහන

